සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

9 ශ්‍රේණිය | **කතෝලික ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ තුන්වන පොත් කාණ්ඩය,
(1) පංචපුස්තකය (2) ඉතිහාස පොත් (3) ප්‍රඥා සාහිත්‍ය (4) එළිදරව් සාහිත්‍ය

02. පුරාණ ගිවිසුමට අයත් ග්‍රන්ථ අතුරින් දිවැසිවර ග්‍රන්ථයක් ලෙස නම් කරනු ලබන්නේ,
(1) ජෝබ් (2) ජොවෙල් (3) I සාමුවෙල් (4) නික්මයාම

03. අපෝසතුලුවරුන්ගේ නායකයා වන මෙතුමා නමින් ලිපි දෙකක් ඇත.
(1) ජොහාන් (2) ජාකොබ් (3) පාවුළු (4) පේදුරු

04. සමදර්ශක කතුවරු තිදෙනාම සමාන ආකාරයට දකින සිදුවීමකි,
(1) ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නානපනය. (2) ජේසුස් වහන්සේගේ උපත.
(3) ජේසුස් වහන්සේගේ කුරුසපත් වීම. (4) ජේසුස් වහන්සේගේ උත්ථානය.

05. ''මම වෙමි'' ප්‍රකාශ මඟින් පෙන්නුම් කරන්නේ,
(1) ජේසුස් වහන්සේගේ මනුෂ්‍යත්වය යි. (2) ජේසුස් වහන්සේගේ දේවත්වය යි.
(3) ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය යි. (4) ජේසුස් වහන්සේගේ ජයග්‍රහනය යි.

06. A - ගැබ්ගැනීමේ වේදනාව
B - පොළොවට ශාප ලැබීම.
C - විළි රුදාව ඇතිව දරුවන් බිහි කිරීම.
D - වනයේ පලා කෑම.
ඉහත දක්වා ඇති දෙවියන් වහන්සේ ආදම්ව, ඒවට, සර්පයාට ලබාදුන් දඬුවම් අතුරින් ආදම්ට පමණක් ලබාදුන් දඬුවම් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) AB (2) BC (3) BD (4) CD

07. කායින් ආබෙල් සිද්ධියේ දී කායින් විසින් ආබෙල් මරා දැමීමට පදනම් වූ මුල් අගුණ පාපය,
(1) ඊර්ෂ්‍යාව (2) ක්‍රෝධය (3) වෛරය (4) මෝහය

08. ඊශ්‍රායෙල් ජාතිය එක්සේසත් කිරීමට තෝරාපත් කරගත් පළමු රජු වන්නේ,
(1) සළමොක් රජතුමා (2) සාවුල් රජතුමා (3) දාවිත් රජතුමා (4) හෙරෝද් රජතුමා

09. වයස අවුරුදු හතට පෙර සිදු කරන වැරදි නම් කරනු ලබන්නේ,
(1) බරපතල පාපය. (2) කර්ම පාපය. (3) සුළු පාපය. (4) මරණීය පාපය.

Past Papers Wiki

10. ''නැති වූ පුත්‍රයාගේ'' උපමා කතාව තුළින් අපට පෙන්වනු ලබන්නේ දෙවියන් වහන්සේගේ,
(1) ආදරය හා කරුණාව (2) රැකවරණය හා ආදරය
(3) ප්‍රේමය හා කරුණාව (4) දයාව හා ප්‍රේමය

11. ශූ. ජකොබ් අපෝස්තුළුතුමන් මගින් ජේසුස් වහන්සේ අපට අණ කරන්නේ,
(1) සමගි සන්ධානය ලබා ගැනීමට යි. (2) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට යි.
(3) ප්‍රසාද ස්නාපනය ලබා ගැනීමට යි. (4) රෝගීන්ගේ ආලේපනය ලබා ගැනීමට යි.

12. දෙවියන් වහන්සේට අයිති වස්තුවක් අප සතු කර ගැනීමට ගන්නා වූ උත්සහය ..... නම් වේ. හිස්තැනට යෝග්‍ය පිළිතුර,
(1) සිය දිවි නසා ගැනීම. (2) මිනී මැරීම.
(3) ගබ්සාව. (4) චරිත ඝාතනය.

13. ''මාගේ ඇටකටු සෑදෙන විට මවු කුසෙහි මා වැඩෙන විට රහසිගතව මා තැනෙන විට මා එහි වූ බව ඔබ දැනසිටි සේක.'' මෙම ප්‍රකාශය උපුටා ගනු ලබන්නේ,
(1) යෙසායා ග්‍රන්ථයෙන් (2) ජෙරමියා ග්‍රන්ථයෙන්
(3) ගීතාවලිය ග්‍රන්ථයෙන් (4) ධර්ම දේශකයා ග්‍රන්ථයෙන්

14. පාපයෙන් මිදීමට.
(1) ශුද්ධාත්ම වරාප්‍රසාද හා බලය තිබිය යුතුය. (2) මාංශ ත්‍යාජ කළ යුතුය.
(3) ආත්ම දමනය කළ යුතුය. (4) අධ්‍යාත්මක බලයෙන් සන්නද්ධ විය යුතුය.

15. A - මිය යන විට වයස අවුරුදු දොළොසකි.
B - ජූලි මස හයවන දින එතුමියගේ මංගල්‍ය පැවැත් වේ.
C - චරිත පාරිශුද්ධිය වෙනුවෙන් දිවි පුද කළා ය.
ඉහත පාඨවලට අදාළ ශුද්ධවරිය වන්නේ,
(1) ශූ. තෙරේසා තුමිය. (2) ශූ. මරියාගොරෙන්ති තුමිය.
(3) ශූ. ඇග්නස් තුමිය. (4) ශූ. විනිප්‍රීඩා තුමිය.

16. 9 වන පනත කඩකිරීමේ වරද දාවිත් රජතුමාට පහදා දුන් දිවැසිවරයා වනුයේ,
(1) එළියා (2) එළිෂා (3) අබිසා (4) නාතාන්

17. කාර්මෙල් කන්ද මත යාග පූජා දෙකක් සූදානම් කළ පාර්ශව දෙක වන්නේ,
(1) එළිෂා දිවැසිවරයා හා බාල් දිවැසිවරයා (2) නාතාන් දිවැසිවරයා හා එළිෂා දිවැසිවරයා
(3) එළියා දිවැසිවරයා හා බාල් දිවැසිවරයා (4) නාතාන් දිවැසිවරයා හා බාල් දිවැසිවරයා

18. දෙවියන් වහන්සේගෙන් ලත් විපුල වරප්‍රසාද හමුවේ මරිමව් ගැයූ ප්‍රශංසාව,
(1) සකරියස් තුමාගේ ප්‍රශංසා ගීය යි. (2) සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීය යි.
(3) සුරදූත ගීය යි. (4) මරිය උදාන ගීය යි.

19. ධ්‍යානයට සම වැදීමේ මුල් පියවර,
(1) සොයා යාමකි. (2) දේව වචනය යි.
(3) මෙනෙහි කිරීමයි. (4) වාචික යාච්ඤාවයි.

20. ක්‍රියාශීලී කුඩා කිතුණු සංඝ පිහිටුවීමේ දී පදනම් කරගනු ලැබුවේ,
(1) මුල් කිතුණු සභාවයි. (2) අසිපා වැඩසටහනයි.
(3) දේව වචනය යි. (4) රදගුරු සමුළුව යි.

(ලකුණු 2 × 20 = 40)

Past Papers Wiki

II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ විශේෂයෙන් සඳහන් වන පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.
(ii) ජනවන්දනාවේ දී ගීතාවලිය ග්‍රන්ථය භාවිත වන අවස්ථා දෙකක් ලියා දක්වන්න.
(iii) වරදට වැටුන කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් දෙකක් ලියන්න.
(iv) නෝවාගේ පුතුන් දෙදෙනෙක් නම් කරන්න.
(v) සාවුල් රජුට බලවත් තර්ජනයක් එල්ල කළ ජාතීන් දෙකක් නම් කරන්න.
(vi) මුල් අගුණ පව් දෙකක් ලියන්න.
(vii) පව්කරුවන්ට සමාව ලබා දෙන බව පෙන්නුම් කරන ශුද්ධ බයිබලයේ සඳහන් උපමා දෙකක් නම් කරන්න.
(viii) ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට දානය කළ බලතල දෙක නම් කරන්න.
(ix) ශුද්ධ වූ දොමිනික් සාවියෝ තුමාගේ මව්පියන් නම් කරන්න.
(x) 'අසිපා' ආරම්භ වීමේ මූලික පරමාර්ථ දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (i) මාක් හා ජොහාන් ශුභාරංචි සඳහා භාවිත වන වෙනත් නම් දෙකක් ලියන්න.
(ii) ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ ඇතුළත් වෙනත් හසුන් තුනක් නම් කරන්න.
(iii) ''ගීතාවලිය ග්‍රන්ථය හා කිතුණු යාච්ඤා දිවිය'' යන මැයෙන් ආගමික ලිපියකට සුදුසු කරුණු පහක් ගොනු කර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) ඒදන් උයනේ පදිංචි කළ ආදම් සහ ඒවට දෙවියන් වහන්සේ පැවරූ වගකීම් දෙක ලියන්න.
(ii) දෙවියන් වහන්සේ ආදම්ට, ඒවට හා සර්පයාට දුන් දඬුවම් එක බැගින් ලියන්න.
(iii) නෝවා සහ ජලගැල්ම සිද්ධිය තුළින් කිතුණු සිසු දරු ඔබේ ජීවිතය හැඩගස්වා ගැනීමේ දී ගතහැකි ආදර්ශ පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) මුල් අගුණ පව් නැතිකර, දියුණු කරගත යුතු ධර්ම ගුණ දෙකක් නම් කරන්න.
(ii) ශුධාත්මයාණන් වහන්සේට විරුද්ධ පව් (ක්‍රියා) තුනක් නම් කරන්න.
(iii) පාප ක්ෂමාව ලැබීමෙන් පසු ''පැරණි මිනිසා'' මුළුමනින්ම ඉවත්කොට ''නව මිනිසකු'' වැළඳගැනීමට ඔබට කළහැකි කාර්යයන් පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) ''පරදාර ආලය'' නැමැති පාපය නිසා නොමඟ ගිය ශුද්ධ බයිබලයේ සඳහන් පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
(ii) භයවන පනතට විරුද්ධ ක්‍රියා තුනක් නම් කරන්න.
(iii) පිවිතුරු දිවියක් ගත කිරීම සඳහා නව යෞවන සාන්තුවරයන්ගේ චරිත ඔස්සේ ඔබ ගන්නා ක්‍රියාමාර්ග පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) නව ගිවිසුමේ ඇතුළත් ප්‍රශංසා ගීත දෙකක් නම් කරන්න.
(ii) එම ප්‍රශංසා ගීතවල සඳහන් දෙවියන් වහන්සේගේ විශිෂ්ඨ ගුණාංග තුනක් ලියා දක්වන්න.
(iii) දිනපතා යාච්ඤාව තුළ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම සුදුසු මන්දැයි ඔබේ අදහස් පහකින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i) මිනිසා පාපයට වැටීම. (ii) සිත් හැරීම හා පව් කමාව
(iii) වීරවරු (iv) රජවරු

(ලකුණු 5 × 2 = 10)

පිළිතුරු පත්‍රය - I කොටස

01. (3)	02. (2)	03. (4)	04. (1)	05. (2)	06. (3)	07. (1)	08. (2)	09. (3)	10. (1)
11.(4)	12. (1)	13. (3)	14. (1)	15. (2)	16. (4)	17. (3)	18. (4)	19. (4)	20. (2)

(ලකුණු 2 x 20 = 40)

II කොටස

01. (i) පේදුරු / පාවුළු . අපෝස්තළුවරු

(ii) පිළිතුරු ගීය සඳහා / යාම යැදුම හා සැදෑ යාම යැදුම

(iii) ශාප ලද්දෙක් වීම. / පොළොවෙන් නෙරපා දැරීම. / වගා කරන විට ඵලදාව නොදීම. / ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිසෙකු වීම.

(iv) ෂෙම් / හාම් / ජපෙත්

(vi) පිලිස්තිවරු / අම්මෝර්වරු

(vii) උඩඟුව / තන්හාව / රාගය / ක්‍රෝධය / කෑදරය / ඊර්ෂ්‍යාව / අලසකම

(viii) නැති වූ පුත්‍රයා පිළිබඳඋපමාව / නැති වූ කාසිය

(viii) පව් කමා කිරීමේ බලය / සුව කිරීමේ බලය

(ix) පියා - චාල්ස් සාර්වියෝ මව - බ්‍රිජට්

(x) උදාසීන කිතුණුවන් අවිදි කිරීමක් / ගිහි නායකත්වයට නිසි තැන දීම. / කිතුණු සංඝ තුළ දේව වචනය කියවීඹ හා ක්‍රියාත්මක වීම.

02. (i) මාක් ශුභාරංචිය - දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය
ජොහාන් - ආධ්‍යාත්මික ශුභාරංචිය

(ii) ජාකොබ් / I පේදුරු / II පේදුරු / I ජොහාන් / II ජොහාන් / III ජොහාන් / ජූද් / හෙබ්‍රෙව්

(iii) සිසුන් ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.

03. (i) ඒදන් උයන වගා කිරීම. / රැකබලා ගැනීම.

(ii) ආදම් - පොළොවට ශාප ලැබීම. / දිවි ඇතිතාක් වෙහෙස මහන්සි වී ආහාර ලබා ගැනීම./ පොළොවෙන් වල් පැළෑටි හා කටු පඳුරු බිහිවීම. / වනයේ පලා කෑම භූමියෙන් වූ මිනිසා යළි භූමියට යන තෙක් දහඩිය මහන්සියෙන් ආහාර සපයා ගැනීම.

ඒවට - ගැබ්ගැනීම වේදනාවක් වීම. / විලිරුදාව ඇතිව දරුවන් බිහි කිරීම. / සැමියාට ආදරය කළ ද ඔහු ඇයව පාලනය කිරීම.

සර්පයාට - සාප ලැබීම. / ජීවිතය පුරාවටම උරගා යමින් දූවිලි කෑම

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකාබලා ලකුණු ලබා දෙන්න.

04. (i) බැහැරපත් කම / තෘෂ්ණාවගන්තකම / බ්‍රහ්මචරියාව / ශාන්තිය / ප්‍රේමය / උද්යෝගය / මිථ්‍යාචාරය

(ii) තම ගැලවීම හා බලාපොරොත්තු කඩකර ගැනීම පාප ක්ෂමාව හා යහපත් ක්‍රියාවන් හී පින් හේතු නොමැතිව ගැලවීමට බලාපොරොත්තු වීම. / ආගමික සත්‍යතා ප්‍රතික්ෂේප කිරීම. / අනුන් ලබන දේව වරප්‍රසාද ගැන ඊර්ෂ්‍යා වීම. / පාපයේ ඇලී ගැලී සිටීම. / පසුතැවිලි නොවී මරණයට පත් වීම.

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. (i) දාවිත් රජතුමා / හෙරෝද් ඇන්ටිපස්

(ii) අසභ්‍ය පතපොත කියවීම. / අසත්‍ය චිත්‍ර හා චිත්‍ර පට තැඹීම / බහු භාර්යා හා බහු පුරුෂ සබඳතා ස්ත්‍රී දූෂණ / සම ලිංගික සබඳතා / බාල අපයෝජනය පුර්ව ලිංගික සබඳතා

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකාබලා ලකුණු ලබා දෙන්න.

06. (i) මරිය උදාන ගීය / සොකරියාස් තුමාගේ ප්‍රශංසා ගීතය / සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය

(ii) දෙවියන් වහන්සේගේ දයාව / සිය සෙනඟ වෙත කරුණාව / පව්කරුවන්ට කමාව / දෙවිදාණගේ දයාවන්ත බව.

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකාබලා ලකුණු ලබා දෙන්න.

07. (i) පිටු අංක 21, 2, 23

(ii) පිටු අංක 52, 53

(iii) පිටු අංක 36, 37

(iv) පිටු අංක 41, 42, 43

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank